# <u>දැන්වීමයි</u>

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**ටවර් හෝල් රඟහල පදනම**

## මරදාන එල්ෆින්ස්ටන් රඟහල් පරිශ්‍රයේ පිහිටි කඩ කාමර අංක : 203/204, 205 කුලියට දීම සඳහා ලංසු කැඳවීම.

ටවර් හෝල් රඟහල පදනම සතු මරදානේ පිහිටි එල්ෆින්ස්ටන් රංගශාලාවට යාබදව ඇති සරසවිපාය සාප්පු සංකීර්ණයේ කඩ කාමර අංක: **203/204,205** සඳහා **2025 / 2027** වසර 03 ක කාලයක් සඳහා කුලී පදනම මත පවත්වා ගෙන යාම වෙනුවෙන් ලංසු කැඳවනු ලැබේ.

උක්ත කරුණට අදාල ලංසු විවෘත කිරීමේ දිනය 2025.01.27 දින සිට 2025.02.11 දින දක්වා දීර්ඝ කිරීමට තීරණය කර ඇත. 2025.01.27 සිට 2025.02.10 දක්වා රාජකාරි දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා වන කාලය තුළ රු.500.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් සහ රු.5000.00 ක ආපසු ගෙවනු ලබන ගාස්තුවක් ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලය වෙත ගෙවා ප්‍රසම්පාදන ලියවිලි ලබාගත හැකිය.

ඒ අනුව ලංසු ඉදිරිපත් කළ යුත්තේ ටවර් හෝල් රඟහල පදනම විසින් ඉදිරිපත් කරනු ලබන ආකෘතිවල පමණි. ප්‍රසම්පාදන ලියවිලි සමඟ නිකුත් කරනු ලබන කොන්දේසිවලට හා විස්තරවලට අනුකූලව විධිමත්ව සම්පූර්ණ කරනු ලැබූ මුද්‍රා තබන ලද මිල ගණන් 2025.02.11 දින පෙ.ව.10.30 ට පෙර **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ටවර් හෝල් රඟහල පදනම, "සවිසිරිපාය"අංක 123,විජේරාම මාවත,කොළඹ-07** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් ඉහත ලිපිනයේ පිහිටා ඇති ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. මිළ ගණන් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"කඩ කාමර සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ සැනින් ලංසු විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ටවර් හෝල් රඟහල පදනම**
**දුරකථනය : 011-2682324**